# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1791/4 - 2012 දෙසැම්බර් මස 31 වැනි සඳුදා - 2012.12.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත**

31 වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු 2007 අංක 27 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත මගින් සංශෝධිත, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 31 වන වගන්තියේ (1අ) උප වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් :

අ. 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත ප්‍රතිරක්ෂණය විය යුතු රක්ෂණකරුවකු විසින් ඇතුලත්වන දීර්ඝකාලීන ප්‍රතිරක්ෂණ ගිවිසුම් හැර, ප්‍රතිරක්ෂණය කළ යුතු සෑම සාමාන්‍ය ප්‍රතිරක්ෂණයකින්ම පැන නගින සම්පූර්ණ වගකීම මත ගෙවිය යුතු ප්‍රතිශතය සියයට තිහක් ලෙස ප්‍රකාශයට පත් කරමි.

ආ. 2007 අංක 27 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත මගින් සංශෝධිත 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ, 31 වැනි වගන්තියේ (1අ) උප වගන්තිය යටතේ, 2007 දෙසැම්බර් මස 19 වැනි දින නිකුත් කරන ලද අංක 1528/20 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියෝගය මෙයින් අවලංගු කරමි.

ඇ. මෙම නියෝගය 2013.01.01 වැනි දින සිට බල පැවැත්වේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

02-117


1A - PG 001525 — 1335 (2012/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.